# ශ්‍රී ලාංකේය සිවිල් සමාජයේ දෘෂ්ටිවාදයන් හැඩගැස්වීමෙහි ලා පශ්චාත් යුදකාලීන සිනමාවේ දායකත්වය

**උෂා අරුණි ප්‍රියංගා වෙල්හේනගේ**


## Abstract

ප්‍රජාතන්ත්‍රවාදී රටක, සමාජයක මහජන පරිමණ්ඩලය (Public sphere) සක්‍රීය වීම කෙරෙහි තොරතුරු ප්‍රවාහය දියුණු මට්ටමක පැවතිය යුතුය. පුරවැසියන් සක්‍රියව මහජන පරිමණ්ඩලය තුළ තම දෘෂ්ටිවාදය සකස් කර ගැනීමෙහි ලා තොරතුරු ප්‍රමාණවත්ව තිබීම හා සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. ඊට අදාළ වන්නා වූ තොරතුරු ලබාදීම හා දෘෂ්ටිවාදයන් සකස් කිරීමෙහිලා සමාජයේ අභිලාෂ කණ්ඩායමක් ලෙස සිවිල් සමාජය සතු භූමිකාව සුවිශේෂී වේ. එමෙන්ම සිවිල් සමාජයේ දෘෂ්ටිවාදයන් සකස් වීම කෙරෙහි අදාල සමාජීය කාරණා බලපානු ලැබේ. එහිදී සිනමා මාධ්‍යය අනෙකුත් කලාවන්ට වඩා සුවිශේෂී වේ. එනම් දෘෂ්ටිවාදී වාහකයකුගේ භූමිකාව නිරූපණය කිරීමට සිනමාව සතුව ඇති ශක්‍යතාවයි. එසේම සිවිල් සමාජයේ දෘෂ්ටිවාදයන් සකස් වීම කෙරෙහි ද සිනමාව වැදගත් වේ. 2009 වසරේ මැයි 18 දින සිට ශ්‍රී ලංකාවේ යුද්ධය නිම වීමෙන් පසු කාලවකවානුව පශ්චාත් යුද සමය ලෙස දැක්විය හැකිවේ. මෙම වාතාවරණය තුළ සිනමාව සතු සුවිශේෂීතා උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකේය සිවිල් සමාජයේ දෘෂ්ටිවාදයන් සකස් කිරීම කෙරෙහි පශ්චාත් කාලීන යුද සිනමාවේ දායකත්වය කෙසේද යන්න පර්යේෂණයෙන් විමසන ලදි. පර්යේෂණයේ අරමුණු දෙකක් කෙරෙහි පර්යේෂකයාගේ අවධානය යොමුවිය. මූලිකව, ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද කාලීන චිත්‍රපට සිවිල් සමාජයේ දෘෂ්ටිවාදයන් හැඩගැස්වීම කෙරෙහි බලපාන ආකාරය හඳුනාගැනීම හා දෙවනුව ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද වාතාවරණය තුළ සිනමා ආඛ්‍යානයන්හි ස්වභාවය හඳුනාගැනීම යන්නයි. පශ්චාත් යුද චිත්‍රපට 18ක් තෝරාගනිමින්, සිවිල් සමාජ සාමාජිකයින් සමග සම්මුඛ සාකච්ඡා හා ඔවුන්ගේ විචාර විමසමින් අන්තර්ගත විමර්ශනයක් ගුණාත්මකව සිදුකරන ලදි. එහිදී,පර්යේෂණ ප්‍රශ්න තුනක් කෙරෙහි අවධානය යොමු කරන ලදි. ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද කාලීන සිනමාවෙහි විවිධ ජාතීන් හා ආගම් නියෝජනය වන්නේ කෙසේද? එය නියෝජනය වන ආකාරය ජාතීන් අතර ගැටුම් තිව්‍ර කරන්නේද නැතහොත් ගැටුම් සමනය කරන්නේද?හා විවිධ ජන වර්ග හා ආගමික අනන්‍යතාවන්ට අයත් සිවිල් සමාජ සාමාජිකයින් ඒවාට ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? යන්නයි.



**ප්‍රමුඛ පද**

සිවිල් සමාජය (Civil Society), දෘෂ්ටිවාදය (Ideology), පශ්චාත් යුද සිනමාව (Post War Cinema)


පර්යේෂණයට අදාළව ප්‍රථමයෙන් "ගැටුම" යන්න විමසා බැලිය යුතුය. ගැටුම යනු පුද්ගලයින් දෙදෙනෙක් හෝ ක්‍රියාකාරකයින් සමූහයක් අතරේ සම්පත්, බලය, ශක්තිය, ප්‍රතිමාන, ඉලක්ක, සම්බන්ධතා සහ ඕනෑ එපාකම් වැනි අභිප්‍රායන් අත්පත් කර ගැනීම සඳහා ඇතිවන ප්‍රතිමල්ල තත්ත්වයන් හා හානිදායක ක්‍රියාවලියක් ය. ඒ අනුව පර්යේෂකයා පශ්චාත් යුද කාලීන සිනමාව, සිවිල් සමාජයේ දෘෂ්ටිවාදයන් හැඩගැස්වීමෙහි ලා කෙරෙන බලපෑම විග්‍රහ කරනුයේ පශ්චාත් ගැටුම් (Post Conflict) නිමාවීම යන වාතාවරණය මත සිට නොවේ.

යුද්ධයක් හටගැනීම සඳහා මිනිසා-මිනිසා අතර සහ මිනිසා-සමාජය අතර වන සම්බන්ධය බලපානු ලැබේ. මිනිසා-මිනිසා අතර මිනිසා සහ සමාජය සම්බන්ධ වීම කෙරෙහි බලපෑම් සහගත කාර්යය ඉටු කරනුයේ සන්නිවේදනය වේ. මිනිසාගේ තොරතුරු අවශ්‍යතාව සපුරාලනු වස් සන්නිවේදන මාධ්‍ය අතර මුද්‍රිත, විද්‍යුත් හා නව මාධ්‍යය මෙන්ම සිනමාව ද සන්නිවේදනය සඳහා දායකත්වය සපයනු ලැබේ.

සිනමාව බිහිවන්නේ ද තම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මිනිසා විසින් සිදුකරන ලද තාක්ෂණික අත්හදා බැලීමක ප්‍රතිඵලයක් වශයෙනි.

මුල් කාලීනව රස වින්දනය උදෙසා සිනමාපට බිහි වූ අතර පසුකාලීනව එහි ඇති සුවිශේෂීබව හේතුවෙන් සිනමාව දෘෂ්ටිවාදී වාහකයකු බවට පත්විය. එනම් දෘෂ්ටිවාදය සකස්කිරීම්, තහවුරු කිරීම්, වෙනස්කිරීම්, සනාථ කිරීම් සඳහා යොදා ගැනීම සිදුවේ.

එමෙන්ම, ලොව පුරා විවිධ සිනමා ප්‍රවාහයන් බිහිවේ. සිනමාවෙහි විවිධ ශෝනර ඇතිවේ. ඒවායෙහි නිර්මාණාත්මක මෙන්ම දෘෂ්ටිවාදී පාර්ශ්වයන් නියෝජනය වීම සිදුවේ. එහි දී සිවිල් සමාජයේ දෘෂ්ටිවාදයන් හැඩගැස්වීමෙහි ලා කෙරෙන බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත්වේ.

ශ්‍රී ලංකාවේ ද 2009 සිට ඇත්තේ පශ්චාත් යුද වාතාවරණයකි. එම වාතාවරණය තුළ බිහිවන චිත්‍රපට පශ්චාත් යුද කාලීන චිත්‍රපට වශයෙන් හැඳින්විය හැක.

ශ්‍රී ලංකාවේ බිහිවන පශ්චාත් යුද කාලීන චිත්‍රපට වර්ග තුනක් යටතේ දැක්විය හැක.

01. යුද විරෝධී චිත්‍රපට
(යුද්ධය ප්‍රතික්ෂේප කරන්නාවූ චිත්‍රපට)
02. යුද ජයග්‍රහණය සමරන සිංහල චිත්‍රපට (War Triumphalism)
(යුද්ධය උත්කර්ෂවත් කරන්නාවූ චිත්‍රපට)
03. ඉතිහාස කතා රැගත් චිත්‍රපට
(ඉතිහාසය ප්‍රතිනිර්මාණය කරන්නාවූ චිත්‍රපට)

එම තෝරාගත් චිත්‍රපට පහත දැක්වේ.

| **අනු අංකය** | **සිනමාපටය** | **තිරගත වූ වර්ෂය** |
|---|---|---|
| 01 | අබා | 2009 |
| 02 | අලිමංකඩ | 2009 |
| 03 | ස්තුතියි නැවත එන්න | 2010 |
| 04 | ඉර හඳ යට | 2010 |
| 05 | ගාමණී | 2011 |
| 06 | සෙල්වම් | 2011 |
| 07 | මහින්දාගමනය | 2011 |
| 08 | ප්‍රතිරූ | 2012 |
| 09 | ඉනි අවන් | 2012 |
| 10 | මාතා | 2012 |
| 11 | විජය කුවේණි | 2012 |
| 12 | සිරිපැරකුම් | 2013 |
| 13 | නිකිණි වැස්ස | 2013 |
| 14 | සිරි දළදාගමනය | 2014 |
| 15 | අනගාරික ධර්මපාල | 2014 |
| 16 | තන්හා රතී රඟා | 2014 |
| 17 | මහරජ ගැමුණු | 2015 |
| 18 | ඔබ නැතුව ඔබ එක්ක | 2015 |

මෙම වර්ගීකරණය යටතේ ඇති අංශ තුනෙහිම චිත්‍රපට පර්යේෂණය සඳහා අවධානයට යොමුකරනු ලැබේ.

සිවිල් සමාජයේ දෘෂ්ටිවාදයන් ප්‍රමාණාත්මක විමසිය නොහැකි වේ. එබැවින් මෙම පර්යේෂණය ගුණාත්මකව සිදු කරන ලදි.

පර්යේෂණය සඳහා තෝරාගනු ලබන්නේ සිවිල් සමාජ සමාජිකයින් 12 ක නියැදියකි. මෙහි සිවිල් සමාජ සමාජිකයින් හඳුනා ගැනීමේ දී අවධානය යොමු කරනු ලබන්නේ ජන මාධ්‍ය ඔස්සේ බහුලව විවිධ කෂේත්‍ර මගින් පර්යේෂණය සිදු කරනු ලබන කාල සීමාව තුළ පශ්චාත් යුද සමයේ දෘෂ්ටිවාදය සකසන කණ්ඩායම් වල පුද්ගලයින් වේ. ඒ අනුව හඳුනාගත් නියැදිය වන්නේ රාජ්‍ය නොවන සංවිධාන, ආගමික නායකයින්, පුවත්පත් මාධ්‍යවේදීන්, කලාකරුවන්, ලේඛකයින්, බුද්ධිමතුන් හා විද්‍යුත් මාධ්‍යවේදීන් වේ. ඒ අනුව, ජයදේව උයන්ගොඩ, කේ.ඩබ්.ජනරංජන, විමුක්ති ජයසුන්දර, භූපති නලින්, අනුරදොරකුඹුර,

කීර්ති වර්ණසූරිය, ටියුඩර් වීරසිංහ, ගාමිණී. වේරගම, සහ තම අනන්‍යතාවය හෙළි කිරීම සඳහා අවසර නොදුන් ප්‍රතිචාරකයින් සිව් දෙනෙක් සමග ආකෘතිගත නොවූ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. ප්‍රාදේශීයව පවතින අනෙකුත් සිවිල් සමාජ සාමාජිකයින්ගෙන් දෘෂ්ටිවාදයන් සැකසීමක් සිදුවුව ද සීමිත අර්ථයෙන් ජාතික වශයෙන් ගත්කල දෘෂ්ටිවාදයන් සකසන කණ්ඩායම් ලෙස ඉහතින් දක්වන ලද සිවිල් සමාජ සාමාජික කණ්ඩායම් සුවිශේෂී වේ. සමාජයේ දෘෂ්ටිවාදය සකසන කණ්ඩායම් සියල්ල හා පුද්ගලයින් ආමන්ත්‍රණය කිරීමේ අපහසුතාවයේ සීමාවන්ට මෙම පර්යේෂණය යටත් වේ.

එසේම, පර්යේෂණය සඳහා තෝරාගන්නා ලද පශ්චාත් යුද කාලීන සිනමාපට පිළිබඳ සිවිල් සමාජ සාමාජිකයින් විසින් මුද්‍රිත, විද්‍යුත් හා නව මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කරන ලද සිනමා විචාර ද පර්යේෂණයේ දී යොදාගන්නා ලදි.

ඒ අනුව තෝරාගන්නා ලද අංශ තුනෙහිම චිත්‍රපට පර්යේෂණකයා පර්යේෂණය පහත දැක්වෙන මූලික කරුණු ඔස්සේ විමර්ශනය සිදුකරන ලදි.

**සිනමා ආඛ්‍යානය තුළ ආගම් හා ජනවර්ග ඒකාකෘති (Stereotype) කර ඇති ආකාරය හා යුගල ප්‍රතිපක්ෂ (Binary Opposition) ගොඩනගා ඇති ආකාරය**

යුද විරෝධී, යුද ජයග්‍රහණය සමරන සිංහල චිත්‍රපට හා ඉතිහාස කතා රැගත් චිත්‍රපට යන වර්ගීකරණය යටතේ පර්යේෂණය සිදුකරන ලදි.

සිනමා ආඛ්‍යානය තුළ ආගම් හා ජනවර්ග ඒකාකෘති (Stereotype) කිරීම හා සහසම්බන්ධ ප්‍රතිපක්ෂ නැතහොත් යුගල ප්‍රතිපක්ෂ (Binary Opposition) ගොඩනගා ඇති ආකාරය දෘෂ්ටිවාදී පාර්ශ්වය ඔස්සේ විමසීම සිදු කරන ලදි. එහිදී ධූරාවලින් (Hierarchy)ප්‍රතිනිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම අදාළ සිනමාපටවල සිදුවන්නේ කෙසේ ද යන්න අවධානයට ලක් කළේ ය. ඉහත කරුණු වලට අදාළව ආඛ්‍යානය ගොඩනගා ඇති ආකාරයෙන් එකී දෘෂ්ටිවාදී සාමාන්‍යකරණයන් සිදුකර ඇත්තේ කෙසේ ද යන්න විමසා බලන ලදි. මූලිකවම අදාළ සිනමාපට විමසීමේදී රජයේ හමුදාව හා එල්.ටී.ටී.ඊ. සංවිධානය දෘෂ්ටිවාදීව දක්වා ඇති ආකාරය පහතින් විග්‍රහ කෙරේ.

සියළු පශ්චාත් යුද චිත්‍රපට විමසීමේ දී යුගල ප්‍රතිපක්ෂ හා ඒකාකෘති සකස් වී ඇත්තේ සැමවිට ම සිංහල ජාතිය මහජාතිය බවත් ඔවුන්ගේ දෘෂ්ටිය මත දෙමළ ජනතාව ජීවත්වන බවත් දක්වමිනි.

එමෙන්ම, එම අධිකාරිත්වය, සංස්කෘතිය තුළ ගතික වීම හරහා ජාතිය" ආගම" ස්ත්‍රී පුරුෂ බව" රට පිළිබඳ යනාදි වශයෙන් තුන්වන ලෝකය තුළ තවමත් සංකේතකරණය හා —අනන්‍යතාවය˜ සඳහා යොදාගන්නා මෙම සාධක ඒකාකෘති ස්වරූපයක් තුළ සවිඥානිකව හෝ අවිඥානිකව යොදා ගැනේ. එම ඒකාකෘතික ලක්ෂණ ම යුගල ප්‍රතිපක්ෂ ලෙස —අනෙකා˜ වෙනුවෙන් උපයෝගී කර ගනී.

ටොඩරොව් සහ වෙන්ස්ටෙන් (1969) (Todorov & Weinstein) ආඛ්‍යානවේදය පිළිබඳ අවස්ථා තුනක් දක්වයි. එනම් ලොව පවතින සාමාන්‍ය ස්වභාවය, එම සාමාන්‍ය ස්වභාවය බිඳ හෙලන කම්පන තත්ත්වය හා නැවත එම කම්පන තත්ත්වයෙන් මිදී සාමාන්‍ය ස්වභාවයට පත්වීම යන්නයි. දෙවන අවස්ථාවෙන් පසු ඇතිවන සාමාන්‍ය තත්ත්වය යනු පෙර තිබූ එකම නොවන බව ටොඩරොව්ගේ අදහසයි. ඔහු එම අවස්ථාව දිය කඩිත්තක් ඇසුරින් විග්‍රහ කරයි.දිය කඩිත්තක් නිසංසලව පැවතීම පළමුවන අවස්ථාවයි. දෙවන අවස්ථාව වන්නේ යමක් එම දිය කඩිත්තට පතිත වීමත් සමගින් දියෙහි ඇතිවන චංචල ස්වභාවයයි. තුන්වන අවස්ථාව වන්නේ කැළඹුණ තත්ත්වය පහ වී නැවත නිශ්චල වීමයි. තුන්වන අවස්ථාවේ නිශ්චල වීම යනු පළමු නිශ්චල වීම නොවේ. දියමත වන කැළඹීම සමග ඉවුර සේදී යාම, මැඩියන්ට මසුන්ට කම්පනය දැනීම ජල පැළෑටි හානිවීම යනාදිය සිදුවීමෙන් පසු නිශ්චල වීම වෙනස් එකකි. යුද්ධයට පෙර උතුර- නැගෙනහිර හා වසර 30ක යුද ගැටුම් නිමා වීමෙන් පසු ඇතිවන පශ්චාත් යුද තත්ත්වය යුද්ධය ඇතිවීමට පෙර තිබූ පරිසරය නොවේ යන්න මනා වැටහීමක් අප සතු විය යුතුය.

ඒ අනුව, මෙම සාධක පදනම් කරගනිමින් විවිධ ජාතීන් හා ආගම් සිනමාපටවල නියෝජනය තුළ ජාතීන් අතර ගැටුම් තීව්‍ර කරන්නේ ද නැතහොත් සමනය කරන්නේ ද යන ගැටලුව වඩා තිව්‍ර මානයක් කරා ගොඩනැගිය හැක.

සිනමාපට විමසුමේදී රජයේ හමුදාව හා එල්.ටී.ටී.ඊ. සංවිධානය දෘෂ්ටිවාදීව හුවා ඇති ආකාරය පුළුල් විමසුමක් හරහා පර්යේෂකයා සාරාංශ කර ඇත්තේ පහත පරිදි වේ.

| රජයේ හමුදාව | එල්.ටී.ටී.ඊ සාමාජිකයින් |
|---|---|
| දේශප්‍රේමීන් වේ | දේශද්‍රෝහීන් වේ |

| | |
|---|---|
| සාමය වෙනුවෙන් කටයුතු කරයි | සාමයට අකමැති පිරිසකි |
| රටෙහි ආරක්ෂා තත්ත්වය තහවුරු කරයි | රටෙහි භීතිය ඇති කරයි |
| යුක්තිගරුකය | යුක්තිගරුක නැත |
| බලවන්ත වේ | දුබලයි |
| මානුෂීය වේ | ම්ලේච්ඡ වේ |
| සහානුභූතිය ඇත | සහනුභූතිය නැත |
| ළමා සොල්දාදුවන් නැත | ළමා සොල්දාදුවන් ඇත |
| ජනතාවට පිහිට වේ | ජනතාවට පිහිට වන්නේ නැත |
| සිවිල් වැසියන් ඝාතනය නොකරයි | සිවිල් වැසියන් ඝාතනය කරයි |
| විනයගරුක වේ | විනයගරුක නැත |
| ශක්තිමත් වේ | දුර්වල වේ |
| සංවිධිත බවක් ඇත | අසංවිධිත බවක් ඇත |
| ශිෂ්ට සම්පන්න පිරිසකි | අශිෂ්ට පිරිසකි |
| වීරත්වය අගයයි | කෲරත්වය අගයයි |

මෙම යුගල ප්‍රතිපක්ෂ හා ඒකාකෘතික තුළ එල්.ටී.ටී.ඊ.ය අභිබවා රජයේ හමුදාව සැමවිට ම සුජාතකරණය කර ඇති බව පෙනේ.එසේම සංවිධානය සකස් වීම පමණක් නොව ඊට මැදිහත් බව ලබාදෙන්නා වූ ජාතිකත්වය පදනම් කර ගනිමින් ද දෘෂ්ටිවාදී අරගලය සිංහල චිත්‍රපට වලින් බැහැර වී නොමැත. ඒ අනුව, සිංහල-බෞද්ධ හා දෙමළ ජාතීන් කෙරෙහි ද මේ ආකාරයේ යුගල ප්‍රතිපක්ෂ හා ඒකාකෘතික අදාළ සිනමාපට වල සකස් වී ඇති ආකාරය පහත දැක් වේ.

| **සිංහල - බෞද්ධ ජාතිකත්වය** | **දෙමළ ජාතිකත්වය** |
|---|---|
| උතුම් ජාතියයි | සුළුතරය පමණි |
| ප්‍රබල ජාතියයි | දුබල ජාතියකි |
| ඉතිහාසයක් ඇත | ඉතිහාසය ලංකාවට අදාළව නැත |
| සහයෝගයෙන් සිටිමට කැමතිය | දෙමළ ජාතිකයාට සිංහලයන් පිළිබඳ විශ්වාසයක් නැත |

මෙම යුගල ප්‍රතිපක්ෂ හා ඒකාකෘතික තුළ ගොඩනංවන දෑ ශ්‍රී ලංකාවේ මාධ්‍ය, කලාව යනාදියෙහි ඒකාකෘතික වී ඇත. සැමවිට ම සිංහල - බෞද්ධ යන්න ඉහළින් තබා ඇති අතර අනෙකුත් ජාතීන් සුළුතරය ලෙස සිංහල - බෞද්ධයින්ගේ කැමැත්ත දිනාගෙන ජීවත්විය යුතුය යන ඒකාකෘතිකය ගොඩනගා ඇත .

යුගල ප්‍රතිපක්ෂ හා ඒකාකෘතික බව සිංහල සිනමාවේ සිංහල - බෞද්ධ හා දෙමළ වාර්ගිකත්වය මත පදනම්ව සිනමාරූප සඳහා වස්තු බීජ සපයන අතරම එකී වස්තු බීජයන්හි සමාජ ධූරාවලීන් ද පැළ කරති. පර්යේෂකයාගේ අනෙක් උත්සාහය වන්නේ පශ්චාත් යුධ සිනමාපටවල සමාජ ධූරාවලීන් හඳුනා ගැනීමයි.

### සිනමා ආඛ්‍යානය තුළ සමාජ ධූරාවලින් (Hierarchy ) හඳුනාගැනීම

කිසියම් සංවිධානයක හෝ සමාජයේ සාමාජිකයන්, සාපේක්ෂ තත්ත්වයට හෝ අධිකාරයට අනුව ශ්‍රේණිගත කර ඇති පද්ධතිය ධූරාවලිය ලෙස හඳුන්වයි. ආගම, ජාතිය, වර්ගය, කුලය, ලිංගිකත්වය, ශරීර වර්ණය යනාදිය අනුව සාපේක්ෂ තත්ත්වයට හෝ අධිකාරයට අනුව ශ්‍රේණිගත කරමින් ධූරාවලි පවත්වාගෙන යාම සිදුවේ. ධූරාවලිය සඳහා පදනම් වන මූලිකය වන්නේ මනුෂ්‍යයා අතර පවතින වෙනස්කම් ය.

ශ්‍රී ලංකාවේ ජනවර්ග හා ආගම පදනම්ව ධූරාවලිය විමසුවිට ද දැකගත හැක්කේ සිංහල - බෞද්ධ ජාතිකවාදය තුළ සිංහල (බෞද්ධ වූ)අධිපතික ස්වරූපයෙන් තම ජාතිය ඒකීය ලෙස සිතීමට පෙළඹී ඇති බවයි . ඊට අවශ්‍ය පාරිසරික හා සමාජීය සාධක අතීතයේ සිට ම ආවකි. හදිසියේ පැන නැගුණු අධිපත්‍යභාවයක් එහි නොමැත. ඇත්තේ පුරුදු පුහුණු කළ අධිපතිබවකි. ඊට ප්‍රධාන හේතුවක් ලෙස

සිංහල -බෞද්ධ යනු ඉතිහාසයකි, ජාතියකි, සංස්කෘතියකි යන ඒකාකෘතිකය තුළ සංදර්භයන් ඊට අවශ්‍ය පරිදි සවිඥාණිකව හා අවිඥාණිකව සංවිධානය කර තිබීමයි. මීට අමතරව සියලු ජාතීන්හි කුල සාධකය පදනම් කර ගනිමින් පුළුල් විභේදනයන් හා එක් එක් ජාතිය පදනම්ව කුල ධූරාවලියක් පවත්වාගෙන යාම ද සිදුවේ.

යුද්ධයට පෙර දකුණ සංවිධානය කළ ආගමික නායකයින්, පුවත්පත් කලාවේදීන්, කලාකරුවන්, ලේඛකයින්, බුද්ධිමතුන්, විද්‍යුත් මාධ්‍යන්හි මාධ්‍යවේදීන් සිවිල් සමාජ කාර්යය යුද ජයග්‍රහණය කරා ගෙන ඒමට කටයුතු කළහ. යුද වැදීම සඳහා තරුණයින් පොළඹාවාලීමට කටයුතු කළහ. නමුත් තරුණයින් හමුදාවට බැඳීම එය එකම හේතුව ද නොවීය. යම් කාර්යභාරයක් සිවිල් සමාජය ඉටු කළහ.

"ගාමනී","සෙල්වම්","මාතා", වැනි චිත්‍රපට යුද්ධයේ පැතිකඩ නිරූපණය කරද්දී ඓතිහාසිකව "අබා" හැරුණු විට "මහින්දාගමනය","විජය කුවේණි","සිරිපැරකුම්","සිරිදළදාගමනය","අනගාරික ධර්මපාල ශ්‍රීමතාණෝ","මහරජ ගැමුණු" යනාදි ඓතිහාසික චිත්‍රපට මගින් පැවති යුද්ධයෙහි විනාශකාරී බව සඟවන ඊට මානුෂිය මුහුණුවරක් ලබා දී ඇත. ඒ සඳහා පසුබිම සකස්කර දුන්නේ බෞද්ධාගමික පරිසරය බව හඟවයි. ආණ්ඩු මේ හැම ගැටුමකට ම මැදිහත් වන්නේ, ජයගත යුතු වන්නේ දේශපාලන අරමුණු සඳහා නොව හුදෙක් ජාතිය හා ආගම එනම් සිංහල - බෞද්ධ සුරක්ෂිතතාවය තහවුරු කිරීමට බව හඟවයි. මානුෂිය යුද්ධ සිදුවන්නේ කෙසේ ද? යුද්ධයක් මානුෂිය ද? යන ප්‍රශ්නය දකුණේ සිංහලයින් අසන්නේ ද නැත එම සිනමාපට ඔස්සේ සිංහල - බෞද්ධයින්ගේ හෙජමොනික අවකාශය සකස් වී ඇත . ඒ තුළ සුළුතර ජාතීන් කෙරෙහි නොසැලකීම, නොවැදගත් සේ සැලකීම, තරම් වටින්නේ නැතිවීම, යටහත්ව සිටිය යුතු බව, යනාදී මානසික තලය තුළ සුළුතර ජාතීන් පිළිබඳ අවමානනීය ස්වභාවයක් සිංහල ජනතාව තුළ ඇති වේ. සුළු ජාතීන් කෙරෙහි සිංහලයා බෞද්ධ වීම තුළ මහා කරුණාවක්, අනුකම්පාවක් යම් යම් අවස්ථාවල දී මතුකොට දක්වයි. එහෙත් එවැනි අවස්ථාවක් උදාවන්නේ රැඩිකල් අදහස් ඇති සුළු ජාතීන් නිසා නොවේ. අහිංසක, මහජාතියට තර්ජනයක් නොවේ යැයි සිතන සුළු ජාතිකයින් කෙරෙහි පමණක් ය. මෙම තත්ත්වය සුළුකොට තැකිය නොහැක. ඉතිහාසයේ සිට ම සිංහල ජාතිය පුරුදු පුහුණු කර ඇත්තේ අන්‍ය ජාතීන් කෙරෙහි අවිශ්වාසය, අමනාපය, අගෞරවය ඇතිවන අයුරින් ය. බෞද්ධාගමික හරය තුළ ජීවත්වන සිංහලයින්ට එසේ කළ හැකි ද? බුද්ධාගම දර්ශනයක් නම් ඒ තුළ සංස්කෘතික වන මිනිසා (සිංහල) තවෙකෙකුට එරෙහි වීමට පෙළඹවිය හැකි ද? යන ගැටළුව මෙම ජාතිකවාදී දෘෂ්ටිවාදයට අනුබල දෙන්නන් කෙදිනකවත් විමසන්නේ නැත. විරෝධාකල්ප දරණ පිරිස පමණක් මේ පිළිබඳ තම දෘෂ්ටිවාදය ප්‍රකාශ කරමින් සිටි.

යම් යම් ක්‍රියාකාරකම්, අදහස්, සමාජ ව්‍යුහය, යනාදිය සාපේක්ෂව එකිනෙක වෙනස්වන විට ගැටුම් ඇතිවීමක් සිදු වේ. ආධිපත්‍ය සහිත ව්‍යුහයක් පවතින විට ගැටුම්කාරි පරිසරයක් ඔවුන්ට බලාපොරොත්තු වීමට සිදු වේ. හේතුව වන්නේ ආධිපති ස්වරූපයක් දරණ ව්‍යුහයක් විසින් ඊට පහළ ස්ථරයන් වෙත තම අභිප්‍රායන් කාන්දු කිරීමට කටයුතු කරයි. එම කාන්දු කිරීමට ගන්නා උත්සාහය මත ඊට එරෙහි වීම් ඇතිවිය හැකි අතර බලාත්මක ව්‍යුහයන් සිදු කරනු ලබන්නේ එම විරෝධාකල්ප මර්දනය කිරීමයි . ජාතිය, ආගම, කුලය, යනාදිය මත තහවුරු කර ඇති "අනන්‍යතාවය" යන්න ආධිපත්‍යයික ජාතියක්, ආගමක්, රටක්, කුලයක් ගනු ලබන්නේ "ස්ව අනන්‍යතාවය" ආඩම්බරයක් ලෙසත් "අන්‍ය අනන්‍යතාව" තර්ජනයක් නැතහොත් පස මිතුරු පාර්ශ්වයක් ලෙසයි. මෙම පර්යේෂණය සඳහා තෝරාගත් චිත්‍රපටවල "ස්ව-අනන්‍යතාව" නැතහොත් සිංහල - බෞද්ධ බව පිළිබඳ, රට පිළිබඳ, ඒකීයබව පිළිබඳ සිංහල - බෞද්ධ යන ආධිපත්‍ය තුළ සිටින බව පෙනේ. විශේෂයෙන් ඉතිහාස කතා රැගත් චිත්‍රපට තුළින් සිංහල - බෞද්ධ අධිපති ස්වරූපය නියෝජනය කරනු ලබයි. ගාමණී, සෙල්වම්, අලිමංකඩ, මාතා, ඔබ නැතුව ඔබ එක්ක, ප්‍රතිරූ වැනි චිත්‍රපට ඔස්සේ සිංහල ජාතිකාවාදය තුළ අධිපතික බව හා අන්‍ය- අනන්‍යතාවය පැහැදිලිව ම තම අනන්‍යතාවය තුළ වෙන්වීම (Separation) යන්න පිළිගෙන ඇති බව පෙනේ.

**පශ්චාත් යුද සිනමාවේ නැඹුරුව**

සිනමා අධ්‍යක්ෂවරු පශ්චාත් යුද වාතාවරණයෙහි පුළුල් තිරය ඔස්සේ වසර 30ක් පැවති යුද්ධය හා පශ්චාත් සංග්‍රාමික සමාජය කුමන ආකාරයෙන් ඔවුන්ගේ දෘෂ්ටිය තුළ සංවිධානය වී ඇත් ද? යන්න ප්‍රදර්ශනය කළහ. එහි දී යුද විරෝධී ආකල්පවලින් යුතු චිත්‍රපට" යුද්ධය උත්කර්ෂණවත් කරන්නා වු චිත්‍රපට හා ඉතිහාසය ප්‍රතිනිර්මාණය කරන්නා වු චිත්‍රපට වශයෙන් වර්ගීකරණ තුනක් යටතේ අධ්‍යක්ෂවරු චිත්‍රපට තැනීය.

දේශපාලන නායකත්වයට සිංහල - බෞද්ධ ජාතිකත්වය ඉස්මතු කරමින් ලබාගත් බලය තහවුරු කිරීමට හා පවත්වා ගැනීම සඳහා ඉතිහාස කතා යොදා ගත්තේ ය. යුධ ජයග්‍රහණයක් සමඟින් සිංහල - බෞද්ධ ඒකීය රාජ්‍යය යන සිහිනය තුළ දකුණ සංවිධානය කිරීමට එමගින් යම් දායකත්වයක් දැක්වීය. මන්ද එම ඉතිහාස කතා මගින් අද්‍යතන නායකත්වය සැමවිට ම සමපාත කරගැනීමට අවශ්‍ය පසුබිම සිංහල

ජනතාවට නිරන්තරයෙන් ම රාජ්‍ය මාධ්‍ය හා රාජ්‍යයට සහාය දක්වන මාධ්‍ය හා සිවිල් සමාජ ක්‍රියාකාරකයින් මගින් ලැබෙමින් තිබුණි.

ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වන ව්‍යුහයන් වන සමාජ, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික සාධක සමග කලාව දෘෂ්ටිවාදීව ක්‍රියාත්මක වන්නේ මෙම අවකාශයන් තුළ වේ. "සාධනීය සාමය" තහවුරු කිරීමෙහි ලා කලාකරුට පැවරෙන සමාජයීය වගකීම සුළුවෙන් තැකිය නොහැක. ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද චිත්‍රපට ආශ්‍රයෙන් විමසීමේ දී දැකිය හැකි ප්‍රධාන නැඹුරුව වන්නේ "නිශේධනීය සාමය" පිළිබඳ පමණක් අවධානය යොමුකර ඇති අතර ඔවුන්ගේ නිර්මාණ තුළින් "සාධනීය සාමය" අනතුරේ හෙළන බවත් "සාධනීය සාමය" පිළිබඳ ඇති තැකීම අධිපති ජාතිවාදය විසින් වසා තබන බවත් ය." සාධනීය සාමය" යනු ගැටුමකට මැදිහත් වී ඇති සියලු දෙනාගේ මූලික මානුෂීය අවශ්‍යතා වටහා ගැනීම හා ඒවා පිළිබඳ සොයාබැලීමයි.

ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද අවධියේ චිත්‍රපටවල ජාතීන් හා ආගම් නියෝජනය වන ආකාරය ජාතීන් අතර ගැටුම් තිව්‍ර කරන්නේ ය යන නැඹුරුව දෙසට වැඩි වශයෙන් දිශාගත වී ඇති අතර ගැටුම් සමනය කිරීම නැතහොත් "සාධනීය සාමය" තහවුරු කිරීමෙහිලා ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයෙහි ඇති හිඩැස්(Gaps) අවම කිරීමට දක්වන ලද දායකත්වය අවම වේ.

සමස්ත චිත්‍රපට විමසිමේ දී දැකගත හැකි කාරණා කිහිපයකි. එනම් ඉහත විමසන ලද ඒකාකෘතික බව , ධූරාවලි පවත්වා ගෙනයාම හා යුගල ප්‍රතිපක්ෂ සබඳතාව යනාදිය විමසා බැලීමේ දී ඉතා ඍජුව හා ඉතා සියුම්ව සිංහල - බෞද්ධ ජාතිකවාදය, සිංහල - දෙමළ ජාතික විභේදනය, යන සංඝටකයන් ඉහත කාරණා සමග ඉතා හොඳින් පවත්වාගෙන යන බව පෙනේ. ජාතික සමගිය, ජාතීන්ට ගරුකිරීම, අනෙකා ඇගයීම, අන්‍යයන්ට සවන්දීම යන කාරණා ඉස්මතුවන පරිදි චිත්‍රපට නිෂ්පාදනය කර තිබුණ ද ඉතා සියුම් නිරික්ෂණයේ දී පැහැදිලි වන්නේ එම චිත්‍රපටවල ජාතීන් හා ආගම් නියෝජනය ජාතීන් අතර ගැටුම් තීව්‍ර කිරීමට ඉවහල් වන බව ය.

## විමර්ශිත ග්‍රන්ථ නාමාවලිය


අමරකීර්ති, ලියනගේ. 2013. ප්‍රජාතන්ත්‍රවාදයෙහිලා ජනමාධ්‍ය භාවිතය නැවත පරික්ෂාවක්: ජනමාධ්‍ය සංස්කෘතිය විවේචනාත්මක ඇගැයීමක්. මහරගමඃ රාවය පබ්ලිෂර්ස් ගරන්ටි ලිමිටඩ්.

ඇල්ලවල, වසන්ත. 2012 දෙසැ. රූපවාහිනි දෘශ්‍ය සංස්කෘතිය පාදක කරගෙන නිර්මාණය වන ප්‍රේක්ෂාමය සමාජයේ සංඥාර්ථවේදී පදනම සංඥාර්ථවෙදී ප්‍රවේශය ජනමාධ්‍යවේදය ජනමාධ්‍ය අධ්‍යයනය සහ විචාරය (වෙළුම 04) හොරණ. ශ්‍රී පාලි ප්‍රකාශන.

උයන්ගොඩ, ජයදේව. 2011. ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

උයන්ගොඩ, ජයදේව. 2008. ගැටුම්, සිවිල් යුද්ධ සහ සාමය ගොඩනැගීමඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

උයන්ගොඩ, ජයදේව., සහ පෙරේරා, රංජිත්. 2012.ප්‍රජාතන්ත්‍රවාදයඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

කුමාර, දර්ශන අශෝක. 2013. ජනප්‍රිය සංස්කෘතිය හා මාධ්‍ය. කොළඹ 10ඃ ෆාස්ට් පබ්ලිෂිං (ප්‍රයිවඩ්) ලිමිටඩ්.

කුමාර, දර්ශන අශෝක. 2014. තොරතුරුවලට හදවතක්. නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

ගම්ලත්, සුචරිත. 2005. ප්‍රතිගාමී පශ්චාත් නූතන වාදය. පොල්ගස්ඕවිටඃ සිකුරු ප්‍රකාශකයෝ.

ජයවර්ධන, කේෂිලා. 2013. මැකියාවෙලිගේ ලෝකයඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

තෙන්නකෝන්, රංජිත්. 2010. දේශපාලන සන්නිවේදනයඃ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය.

දේවසිරි, නිර්මාල් රංජිත්. 2015. දෙමළාගේ ප්‍රශ්නය. දෙහිවලඃ ලකුණ ප්‍රකාශන.

දිසානායක, විමල්. 2007. නව විචාර සංකල්ප. බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශකයෝ.

දිසානයක, විජේසිංහ. 2012 දෙසැ. තිර මාධ්‍යයෙහි සංඥාර්ථ භාවිතය පිළිබඳ බහුමානීය දෘෂ්ටිවාද විග්‍රහය. සංඥාර්ථවෙදී ප්‍රවේශය ජනමාධ්‍යවේදය ජනමාධ්‍ය අධ්‍යයනය සහ විචාරය (වෙළුම 04) හොරණ. ශ්‍රී පාලි ප්‍රකාශන

පරණවිතාන, කරු. 2008. සිව්වෙනි ආණ්ඩුවේ දේශපාලනය. පුංචි බොරැල්ලඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

පෙරේරා,රංජිත්. 2011. නිව්ටන් ගුණසිංහ තෝරාගත් ලිපිඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

රාවය ප්‍රකාශන. 2013. ජනමාධ්‍ය සංස්කෘතිය විවේචනාත්මක ඇගැයීමක්, මහරගමඃ රාවය පබ්ලිෂර්ස් ගරන්ටි ලිමිටඩ්.

වික්‍රමාරච්චි, සමන්. 2009. සිනමා ඇගවුම්කාරකය හෙවත් කැඩපත් මායාව. චිත්‍රපට. (පළමු කලාපය).කොළඹ 07ඃ ජාතික චිත්‍රපට සංස්ථාව

වික්‍රමාරච්චි, සමන් 2008. සිනමා ඇඟවුම්කාරකය හෙවත් කැඩපත් මායාවː සිනමාව පිළිබඳ මනෝ විශ්ලේෂණීය කියවීමක්. චිත්‍රපට. (ජූලි - සැප්ඵ කලාපය). කොළඹ 7ත ජාතික චිත්‍රපට සංස්ථාව

විජේබන්ඩාර, ප්‍රියාන්. ආර්. 2012. මහේශාක්‍ය සිනමාව මහපාරට කැඳවීමක්. නුගේගොඩː නැණිල පබ්ලිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

විජේබණ්ඩාර,ආර්.පී.2013. පශ්චාත් යුද කාලීන ශ්‍රී ලංකාවේ හෙජමොනිය හා දෘෂ්ටිවාදය ගොඩනැගීමෙහි ලා මාධ්‍ය භූමිකාව.

විජේසිරිවර්ධන, සුනිල්. 2010. පුරවැසි මංපෙත්. හෝමාගමː සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්) සමාගම.

විජේසිරිවර්ධන, සුනිල්. 2006.Waterඅක්ෂරය සමඟ ලාංකීය දෙබිඩ්ඩන්. විහව්. කොළඹ විහව් ලලිත කලා ඇකඩමිය.

විජේතුංග, ගාමිණී. 1994. සිනමාව, සංස්කෘතිය හා මතවාදය. කිරුළපනː ලලිත් මිල්රොයි (ප්‍රයිවට්) ලිමිටඩ්.

වීරසිංහ, ප්‍රදීප්. 2013. ජනමාධ්‍යවේදය, න්‍යාය භාවිතය සහ ගැටළු. පන්නිපිටියː සීමාසහිත ස්ටැම්ෆර්ඩ් ලේක් (පුද්) සමාගම.

වීරසිංහ, ටියුඩර්. 2005. සිනමාවේ සම්භවය. කොළඹ 07ː ජාතික චිත්‍රපට සංස්ථාව.

වීරසිංහ, ටියුඩර්. 2007. ජනමාධ්‍යවේදීය සමාජ විද්‍යාව. නුගෝගොඩː සරසවි ප්‍රකාශකයෝ.

වීරසිංහ. ටියුඩර්., සහ රාජපක්ෂ, චන්ද්‍රසිරි. 2002. ජනමාධ්‍යවේදය. නුගේගොඩː සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන.

වීරසිංහ, ටියුඩර්. 2013. ගෝලීය සමාජය හා එහි දෘෂ්ටිවාදය (දෙවන මුද්‍රණය). ආණමඩුවː තෝතැන්න පබ්ලිෂිං හවුස්.

වීරසිංහ, ටියුඩර්. 2011. මාක්ස්වාදී සහ නව මාක්ස්වාදි සංහතික මාධ්‍ය න්‍යාය. නුගේගොඩː සරසවි ප්‍රකාශකයෝ.

වීරසිංහ, ටියුඩර්. 2001, අංක 01. ජනමාධ්‍යවේදය හා සංස්කෘතික අධ්‍යයනයේ ක්‍රමවේදී ගැටළු. සන්නිවේදන ශාස්ත්‍රීය සංග්‍රහයː ගොඩගේ ප්‍රකාශකයෝ.

ෂ්මිඩ්, ඇලෙක්ස්. පී 2002 අංක 01. ගැටුම සහ සාමයː දෛනික ව්‍යවහාරය සහ සමාජීය විද්‍යා ව්‍යවහාරය. ප්‍රවාද. (ජනවාරි - දෙසැ. කලාපය). සමාජ විද්‍යාඥයින්ගේ සංවිධානය.

සුගතදාස, ලින්ටන්. 2013. දේශපාලන සංකල්ප. වරකපොළː ආරිය ප්‍රකාශකයෝ.

සෙනෙවි, සුනිල්. 2013. සිංහල සිනමාවේ චිත්‍රපට කියවීමේ ශාස්ත්‍රීය අවසංවර්ධනයේ ප්‍රකාශනයක් ලෙසː ජනමාධ්‍ය සංස්කෘතිය විවේචනාත්මක ඇගයීමක්, මහරගමː රාවය පබ්ලිෂර්ස්.

සෙනෙවි.හිනිදුම සුනිල්. 2013. ශ්‍රී ලංකාවේ පශ්චාත් ගෝලීයකෘත සිනමාවේ සුසමාදර්ශ මාරුව ප්‍රතිසන්දර්භගත කිරීමːප්‍රසන්න විතානගේගේ සහ අශෝක හඳගමගේ සිනමා නිර්මාණ පිළිබඳ අධ්‍යනයක්.

හීනටිකුඹුර, එරන්ත සහන් බණ්ඩාර. 2012 අගෝ තොරතුරු පාලනය මගින් මතවාද ගොඩනැගීමෙහි ලා සංඥාර්ථවේදී භාවිතය පිළිබඳ විමසුමක්. සංඥාර්ථවෙදී ප්‍රවේශය ජනමාධ්‍යවේදය ජනමාධ්‍ය අධ්‍යයනය සහ විචාරය (වෙළුම 03) හොරණ. ශ්‍රී පාලි ප්‍රකාශන

හෙට්ටිආරච්චි, රංජන්. (2014). සන්නිවේදනයේ භාෂාත්මක ප්‍රවේශය. නුගේගොඩː සරසවි ප්‍රකාශකයෝ.

Abeysekara, Ananda. 2001. The saffron Army,Violence,Terror(ism): Buddhism,Identity, and difference in Sri Lanka.

Benyahia, Sarah.C, Gaffney, Freddie; White, John. 2008. Film Studies as the Essential Introduction. (2nd Edi). New york ( Routledge.

Bastin, Rohan. 2009.Contemporary religiosities:emergent socialities and the post-nation- state: Sri Lankan civil society and its fanatics.

Dewasiri, N.R. 2013. History after the war: Historical consciousness in the collective sinhala-Buddhist psyche in post war sri lanka.

Dulac, Germaine. 2004.The Essence of the Cinema: The visual Idea. Film theory: Critical Condepts in media and Cultural Studies. (Vol:I) New York ( Roulledge.

Hansen, Miriam. 1982. Cooperative Auteur ciema and oppositional public sphere: Alexander Kluge's Contribution to Germany in Autumn. Special Double Issue on New German Cinema. Retriered Jan 1b, 2015.

Kluge, Alexander, Levin, Thomas.Y., Hansen, Miriam. B. 1982. Film and the Public Sphere. Special Double Issue on New German Cinema.

Todorov, Tzvetan and Weinstein, Arnold. 1969. Structural Analysis of Narrative. Philadelhpia: Duke University Press.

**වෙබ් අඩවි**


ඒකනායක, නිර්මාල්.http://www.vikalpa.org/?p=8354"සෙල්වම්" ගෙන් දාන සෙල්ලම් කන්නන්ගර, විදර්ශන (2013). *දේශපාලන සිනමාව හා සිනමාවේ දේශපාලනය.* (දෙසැ 28.2014) http://sinhala.theindipendent.lk/featured/art/item/1915-zero-dark-thirty

කන්නන්ගර ,විදර්ශන https://bavaweb.wordpress.com/2017/04/08බබාලන්තයේ වීරකාව්‍යය

කරුණානායක,දිනිඳු සහ වරදාස්,ත්‍යාගරාජා http://www.vikalpa.org/?p=9943

කහටපිටිය,ජයන්ත සහ ක්‍රිෂාන්ත කුමාර,චමින්ද.(2013,ජනවාරි 15).හඳුනාගත්තොත් ඔබ මා-ජාතිවාදය තුළ දිය නොවූ හෘද සාක්ෂිය www.boondi.lk16:14:05

ගලප්පත්ති, අජිත්http://www.divaina.com/2014/10/30/sarasavi%204.html දේශප්‍රිය ගේ සිනමාවේ තෘෂ්ණාදාසකත්ව රති රඟා

ජනප්‍රිය,බී.ජී.එම්.http://lankalivestar.com/index.php/point-of-view?start=120යථාවක් මගහැර යන්නට උත්සාහ කරන - ප්‍රතිරූ

තිලකරත්න, කසුන්.(2014,මැයි 8). *සමාජ සම්මත දෘෂ්ටිවාද, කලාව සහ අපි (පළමු කොටස)*www.boondi.lk

ධර්මදාස,චින්තන.(2011)*පෙරුම්පිරුවෙ මං සමනලයෙක් වෙන්න - සිද්ද වුණේ මට යුද සෙබලෙක් වෙන්න.*.Saturday, December 10, 2011http://c-u-l-t.blogspot.com/2011/12/blog-post.html

ප්‍රතිරූ කියැවීම. http://v1.mirrorarts.lk/news/films/item/618-prathi-ru

ප්‍රනාන්දු, ඇන්ටන්. එම්. https://bavaweb.wordpress.com/2017/10/27/ ජාතික-රාජ්‍යයේ-අයිතිය සිංහල-බෞද්ධයා ට පමණ ද?

ප්‍රනාන්දු,ඇන්ටන්.එම්. https://bavaweb.wordpress.com/2017/10/07/ජාතිකත්වය-සහ-එහි-නැගීම

රත්නායක ගැන! බූන්දි, 01:31:35 http://www.boondi.lk/article.php?ArtID=1272

විජේනායක,මොහාන්.( බදාදා, ඔක්තොම්බර් 13, 2010) "ඉර හඳ යට" ගැන නොව, බෙනට්

විජේබණ්ඩාර, ප්‍රියාන්, ආර්.සෙල්වම් ගැන නෙවෙයි... ලීලාරත්නලා ගැනයි.http://www.boondi.lk/article.php?ArtID=2329

විජයගුණසේකර,මේනක.(2015),http://www.boondi.lk/article.php?ArtID=4799 Renata Salecl තෝරාගැනීමේදී අප තුළැති අහිතකර ග්‍රස්තිය

http://ramachandrageadaviya-ramachandra.blogspot.com/2011/11/selvam-entertaining-object-in.html.ජයග්‍රාහී මධුපානෝත්සවයේ දමිල කටගැස්ම / Selvam - An entertaining object in a victorious orgy- 2011

https://nowshowing.lk/news/956-2017-07-20-06-25-26"යුද්ධය ගැන ගැඹුරු සිනමාවක් බිහි වෙනු ඇත්තේ උතුරෙනුයි", https://vannipost.wordpress.com/2013/02/07/, http://www.colombotoday.com/, http://www.divaina.com/2013/08/09/cineart02.html

Peter Dahlgren 2005 The Internet, Public Spheres, and Political Communication: Dispersion and Deliberation.


**සම්මුඛ සාකච්ඡා**


උයන්ගොඩ,ජයදේව.(2016,06,29).පෑව:7.00.කලුබෝවිල නිවස
ජනරංජන,කේ,ඩබ්.(2017,05,22).පෑව.1.30.රාවය පුවත්පත් ආයතනය
ජයසුන්දර,විමුක්ති.(2016,07,29).පෙෑව:11.00.බත්තරමුල්ල
නලින්,භූපති.(2017.10.21).පෑව:12:30.කොළඹ විශ්ව විද්‍යාලය
දොරකුඹුර,අනුර.(2017,04,29). පෑව:12.30. අයි.ටී.එන් ආයතනය
වර්ණසූරිය,කීර්ති.(2016,06,24).පෑව:2.00.උපාලි පුවත්පත් ආයතනය
වීරසිංහ,ටියුඩර්.(2017,10,14).පෙෑව:10.00.මහරගම
වේරගම,ගාමිණී (2016,08,30). පෙෑව.10.30. සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
ප්‍රතිචාරක 01
ප්‍රතිචාරක 02
ප්‍රතිචාරක 03
ප්‍රතිචාරක 04